සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு**

Ministry Of Education, Information Technology & Cultural Affairs

Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry

මගේ අංකය / எனது இல / My Number } ME/E/2(සබර/ව)

ඔබේ අංකය / உமது இல / Your Number }

දිනය / திகதி / Date } 2016/11/16

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක**

**සබර/2016/05**

සබරගමුව පළාත් සභා පාසල්වල සියලුම විදුහල්පතිවරු වෙත,

## පාසල්වල ගුරු තුලනය පිළිබඳවයි

සබරගමුව පළාත් සභා පාසල්වල ගුරු තුලනය පිළිබඳ සැළකීමේදී, විශේෂයෙන්ම නගරබද පාසල්වල අනුමත ගුරුවරු සංඛ්‍යාවට වඩා අතිරික්තව ගුරුවරුන් රඳවා ගෙන සිටින බවට වාර්තා වේ. මෙම තත්ත්වය බරපතල වරදක් වන අතර මේ වන විට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් පාසල් පාදකව ගුරුවරුන් ඒ ඒ පාසල් සඳහා නිශ්චිතව හඳුනා ගෙන අනුමත කර ඇත. ඒ අනුව ඔබ පාසලට නියමිත ගුරු සංඛ්‍යාවට වඩා අතිරික්තව ගුරුවරු පාසලේ රඳවා ගෙන සිටී නම් එය රජයේ මුදල් අවභාවිතයක් වේ. අතිරික්ත ගුරුවරු සඳහා මාසිකව විශාල මුදලක් රජයට වැය කිරීමට සිදු වේ. එබැවින් වහාම මෙම තත්ත්වය පාලනය කර අනුමත ගුරුවරු සංඛ්‍යාව පමණක් තම පාසලේ රඳවා ගැනීමට කටයුතු කිරීම පාසලේ විදුහල්පතිවරයාගේ ප්‍රධාන වගකීම වේ.

02 ඒ අනුව 2017 ජනවාරි මස සිට අනුමත ගුරු සංඛ්‍යාවට වඩා පාසලේ රඳවා ගන්නා ගුරුවරු සඳහා ගෙවන වැටුප අදාල විදුහල්පතිවරයාගෙන් අයිභාර කිරීමට සිදු වන බව අවධාරණය කරමි.

03 මේ වන විට පළාතේ ප්‍රධාන නගර වන කෑගල්ල, රත්නපුර, මාවනැල්ල, ඇඹිලිපිටිය, බලංගොඩ, ඇහැලියගොඩ, රුවන්වැල්ල, වරකාපොල වැනි නගර ආශ්‍රිත පාසල්වල ගුරු අතිරික්තය පවතින බව වාර්තා වන අතර ග්‍රාමීය දුෂ්කර ප්‍රදේශ වල ගුරු හිඟයන් පවතී. ඒ අනුව අදාල අතිරික්ත ගුරුවරුන් තම කලාපයේ ගුරු හිඟයක් පවතින පාසල් සඳහා ස්ථාන මාරු කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතුය.

ගරු අමාත්‍යතුමා / Hon.Minister
Office-045-5623222,045-2287306
Residence-045-2222538
Mobile-077-9102001
Fax-045-2228042

අමාත්‍යාංශ ලේකම් / Secretary
Office-045-2223015
Residence-045-2232985
Mobile-071-4402000
email-msweerasooriya@gmail.com

කාර්යාලය / Office
නවනගරය,රත්නපුර.
Newtown,Rathnapura.
Office-045-2222542
Fax-045-2228042

04 එබැවින් වහාම මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා විදුහල්පතිවරුන් විසින් තම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට අදාල විස්තර ලබා දී අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මහින්ද එස්.වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

පිටපත් : 01 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, සබරගමුව - දැ.පි.
02 සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු - දැ.පි
03 සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු - දැ.පි